ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම
අවසාන පරීක්ෂණය 2008
සාධාරණත්වයේ මූලධර්ම - LWU 1202
කාලය - පැය තුනයි.

---

දිනය - 2008 මාර්තු මස 26 වන දින වේලාව - පෙ.ව. 09.30 - ප.ව. 12.30 දක්වා

---

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. පළමු කොටසෙන් එක් ප්‍රශ්නයකට ද දෙවන කොටසෙන් ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

**පළමු වන කොටස**

01. සාධාරණත්වය එහි නම්‍යතාවය, ප්‍රබල ක්‍රියා පටිපාටිය හා වඩාත් සුදුසු ප්‍රතිකර්මයන් හේතුවෙන් ඉතා ජනප්‍රිය විය. තවද එයටම අදාල වූ ස්ථාවර රීති නොවූ අතර එක් එක් චාන්සලර්වරයා විසින් තමාගේ හෘද සාක්ෂියට අනුව තීරණ දෙන ලදි. කෙසේ වෙතත් මෙය නඩුවල ප්‍රතිඵල පිළිබඳ වූ විවේචන උද්ගත වීමට හේතු විය.

ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

02. පොදු නීතිය හා සාධාරණත්වය අතර එක් වැදගත් වෙනස්කමක් වන්නේ තීරණවලට බලපාන රීතිවල මූලාශ්‍රයයි. පොදු නීතියේ දී, නෛතික සිද්ධාන්ත සහ පනත් ඇසුරෙන් තීන්දු දෙනු ලබයි. මෙයට වෙනස්ව සාධාරණ බව හා නම්‍යතාව කෙරෙහි අවධාරණය කරන සාධාරණත්වයේදී සාධාරණත්වයේ ආප්ත වශයෙන් හඳුන්වනු ලබන සාමාන්‍ය මාර්ගෝපදේශයන් පමණක් ඇත.

ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

**දෙවන කොටස**

03. කමල් මහතාගේ අන්තිම කැමති පත්‍රයේ එන පහත සඳහන් පැවරුම් මගින් වලංගු භාරයක් නිර්මාණය වේදැයි සාකච්ඡා කරන්න.

(අ) මාගේ පුස්තකාලය නඩත්තු කිරීම සඳහා මාගේ සහෝදරයා වන සුසිල්ට රු.200,000/- ක්.

(ආ) කහවත්තේ පිහිටි මාගේ ඉඩමේ ගංජා වැවීමට හා එහි ලාභය මාගේ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා යෙදවීමට.

(ඇ) මාගේ බැංකු ශේෂයේ වැඩි කොටස මාගේ ඥාති සොහොයුරිය වන සිතාට.

(ඈ) මගේ පවුලේ වඩාත්ම හොඳ සාමාජිකයන් අතර හරිනි විසින් බෙදා දෙනු ඇතැයි යන අපේක්ෂාවෙන් මාගේ බුදලයේ ඉතිරිය මගේ බාල නැගණිය වන හරිනිට.

04. "ශ්‍රී ලංකාවේ භාර නීතියේ විශේෂ ප්‍රතිපාදන සලසා නොමැති විට භාර ආඥා පනතේ 2 වන වගන්තිය මගින් ඉංග්‍රීසි නීතියේ සාධාරණත්ව මූලධර්ම අදාල කර ගැනීමට ඉඩ සලසයි."

L.J.M.Cooray, *The Reception in Ceylon of the English Trust*, p.37

ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

05. "පුණ්‍ය කටයුතු එහි නෛතික අර්ථයෙන් ගත් කල ප්‍රධාන කොටස් 4 කින් සමන්විත වේ. දුගී භාවයට සහනයක් සැලසීම සඳහා වන භාර, අධ්‍යාපනයේ ප්‍රගමණය සඳහා වන භාර, ආගමික ප්‍රගමනය සඳහා වන භාර හා ඉහත ශීර්ෂයන් කිසිවකට අයත් නොවන්නා වූ සමාජයට උපකාර වන අනෙකුත් අරමුණු සඳහා වන භාරයන් වේ."

*ආදායම් බදු කොමසාරිස් එ.පෙම්සෙල්* [1981] AC 531,583

ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. ශ්‍රී ලංකා නීතියේ හා ඉංග්‍රීසි නීතියේ පුණ්‍ය භාරයක් නිර්මාණය කිරීමට සපුරාලිය යුතු අවශ්‍යතාවයන් සංසන්දනය කිරීම හා වෙනස් කොට දැක්වීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.

06. (අ) අදාල කාලය තුල බල පවත්නා කුමන නීතියක් යටතේ වුවද යුතුකම් කඩකිරීමක දී භාරකරුට එරෙහිව නඩු පැවරිය හැකි බවට භා.ආ.පනතේ 3(j) වගන්තිය මගින් පූර්වාපේක්ෂණය කරයි. භාරකරුගේ වගකීමට අදාල විශේෂ අවස්ථා සලකමින් භාරකරුගේ වගකීම් පැහැදිලි කරන්න.

(ආ) භාර කතෘගේ චේතනාව ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා අර්ථලාභියාට ඇති අයිතිවාසිකම් කෙටියෙන් පැහැදිලි කරන්න.

07. (අ) රන්මල් හා සුනිල් සුළු පරිමාණ තේ අපනයන ව්‍යාපාරයක හවුල් කරුවෝ වූහ. 2006 දී මෝටර් රථ අනතුරකින් රන්මල් මිය ගියේය. සුනිල්, හවුල් ව්‍යාපාරය අවසන් කිරීම වෙනුවට ව්‍යාපාරයේ සියළු වත්කම් රඳවා ගත්තේය. රන්මල්ගේ පුත් සඳමල් ව්‍යාපාර ප්‍රාග්ධනයේ තම පියාගේ කොටසින් ලබන ලාභය ඉල්ලා සිටින නමුත් සුනිල් කිසිදු කොටසක් දීම ප්‍රතික්ෂේප කරයි.

සඳමල් ට උපදෙස් දෙන්න.

(ආ) සිල්ලර බඩු කඩයක හිමිකාරිය වන මාලා, ලේ පරීක්ෂාවක් සඳහා තම පවුලේ වෛද්‍යවරයා වෙත ගියාය. මාලාට ලේ පිළිකාවක් පවතින බව වෛද්‍යවරයා ඇයට පැවසීය. ලේ පිළිකාවේ ප්‍රතිඵල පිළිබඳව කණස්සල්ලට පත් මාලා තමා මරණයට පත් වනු ඇතැයි බියට පත් වූවාය. එම නිසා ඇය තම සිල්ලර බඩුකඩය ඇගේ සොයුරු සම්පත්ට පැවරුවාය. මාස තුනකට පසු පවුලේ වෛද්‍යවරයා මාලා අමතා සමාව අයැදිමින් ප්‍රකාශ කළේ ඇයගේ ලේ පරීක්ෂාව වෙනත් රෝගියකුගේ පරීක්ෂාවක් සමඟ මාරු වී ඇති බවත් ඇයගේ ලේ පරීක්ෂාවෙන් පිළිකා රෝගයක් හෙළි වී නොමැති බවට සනාථ වූ බවත් ය. ඉන් පසු මාලා සිල්ලර බඩු කඩය නැවත තමාට පවරන ලෙස සම්පත් ගෙන් ඉල්ලා සිටියා ය. සම්පත් එසේ කිරීම ප්‍රතික්ෂේප කළේය.

මාලාට උපදෙස් දෙන්න.

08. පහත <u>ඕනෑම දෙකක්</u> පිළිබඳව සටහන් ලියන්න.

(අ) භාරයක ස්වභාවය.
(ආ) Cy-pres සිද්ධාන්තය.
(ඇ) භාරයන් කඩ කිරීම.

\- හිමිකම් ඇවිරිණි. -